**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල අංශය**
**පාසල් නිවාඩු කාලයට ශිෂ්‍ය උපකාරක අත්වැල**

# සිංහල භාෂාව හා සාහිත්‍යය
# 6 ශ්‍රේණිය

**ඔබ උගත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**නරි නයිදේ රැවටිච්චි:**

1. (i) විලේ පිපුණු මල් වර්ග තුනක් ලියන්න.
   1. ............................................ 2. .................................... 3. ................................
   (ii) "දැනි ඉතින් මේ විල රැකගෙන ඉඳලා ඇති කාරියක් නෑ."
   (අ) මෙසේ කීවේ කවුද? ..................................................................................
   (ආ) "විල රැකගෙන ඉඳලා ඇති කාරියක් නෑ." යයි කීවේ ඇයි?
   ..............................................................................................................................
   (iii) ඉබ්බා කොකුන්ට පිංසෙණ්ඩු වුණේ කුමක් කියමින් ද?
   ..............................................................................................................................
   (iv) ඉබ්බා දෙණියට වැටුණු ආකාරය කතාවේ දක්වා ඇත්තේ කෙසේ ද?
   ..............................................................................................................................
   (v) මෙම කතාවෙන් අපට ලබා දෙන ආදර්ශයක් ලියන්න.
   ..............................................................................................................................
   (vi) සමාන පද යා කරන්න.

| | |
|---|---|
| (අ) පිපුණු | යහළුවන් |
| (ආ) නෙලුම් | අගක් |
| (ඇ) හිරු | පක්ෂීහු |
| (ඈ) දැකුම්කලු | විකසිත වූ |
| (ඉ) කුරුල්ලෝ | ලිහිල් |
| (ඊ) පොළොව | සියපත් |
| (උ) මිත්‍රයන් | සූර්යයා |
| (ඌ)කෙළවරක් | භූමිය |
| (එ) උපකාරයක් | අලංකාර |
| (ඒ) බුරුල් | උදව්වක් |
| | සමූහයක් |
| | සතුටින් |

**උදයසිරි :**

2. (i) උදයසිරි පද්‍ය පන්තිය කාගේ නිර්මාණයක් ද?
   (ii) පහත සඳහන් පද්‍යය සම්පූර්ණ කරන්න.

පිපී ගියා වූ ගන මූකලන් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙතී
..........................................................................
..........................................................................

(iii) ජනේලයෙන් නිවස තුළට හිරු රැස් ගලා එන්නේ කෙසේ ද?
..........................................................................

(iv) පැදි පෙළේ සඳහන් උපමා දෙකක් ලියන්න.
(අ) ..........................................................................
(ආ) ..........................................................................

(v) පහත සඳහන් අදහස් දැක්වෙන කවි පද උපුටා ලියන්න.
(අ) ළමයෝ, මේ තරම් වෙලා නිදන්නේ ඇයි?
..........................................................................
(ආ)ගොවියා ගමන් කළ ආකාරය අලංකාරයි.
..........................................................................
(ඇ)මේ අලුත් වූ සීත සුළං හමන්නේ
..........................................................................
(ඇ)නිවසට වී නිකරුණේ සිටීමෙන් පලක් නැත.
..........................................................................

**වීවෙං චුලහෙං යමු කිරි නෑනෝ:**

(i) වීවෙං චුලගෙං යමු කිරි නෑනෝ පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?
..........................................................................

(ii) එම කෘතිය පරිවර්තනය කළේ කවරෙක් ද?
..........................................................................

(iii) වැද්දන් සතු ව තිබූ ආයුධ මොනවා ද?
..........................................................................

(iv) “ගමා, කයිරා මේ කුඩමසුන්ට වහ තළාපියව්.”
මෙසේ කීවේ කවුද?
..........................................................................

(v) විරුද්ධාර්ථවත් පද ලියන්න.

දක්ෂ -
ආරක්ෂා -
සෙමින් -
උණුසුම් -
බහුල -
විශාල -
පොහොසත් -
කලාතුරකින් -
ප්‍රීතිය -
ගැඹුරු -

(වරල, අදක්ෂ, නොගැඹුරු, අනාරක්ෂා, දුප්පත්, නිතර, ශෝකය, කුඩා, වේගයෙන්, සිසිල්)

2 ජපන් ජත්‍යන්තර චිත්‍ර තරගයෙන් ජය ලැබූ ඔබේ මිතුරු සුවිමල්ට සුබ පැතීම සඳහා සුබපැතුම්පතක් නිර්මාණය කරන්න.

**අක්ෂර මාලාව:**

පහත සඳහන් නිදසුන අනුව දී ඇති වචනවල ස්වර සහ ව්‍යඤ්ජන අකුරු වෙන් කර ලියන්න.

- **ගුරුතුමිය = ග්+උ+ර්+උ+ත්+උ+ම්+ඉ+ය්+අ**
- පෝෂණය = ........................................................................................
- මූකලාන = ........................................................................................
- නරිනයිදේ = ........................................................................................
- පොරොන්දුව = ........................................................................................
- වලාකුළු = ........................................................................................
- නෙලුම් = ........................................................................................
- පොරමොලා = ........................................................................................
- කුඩමස්සා = ........................................................................................
- කුරුල්ලෝ = ........................................................................................
- කැලෑබද = ........................................................................................

- දී ඇති වචනවල තද කළු අකුරින් මුද්‍රිත අකුරේ ඇතුළත් පිල්ලම නම් කරන්න.

1. නාට්‍යය = ...................................................
2. රුපියල = ...................................................
3. ශීතල = ...................................................
4. පැහැසර = ...................................................
5. මූදු පුත්තු = ...................................................
6. පැතිරීම = ...................................................
7. කෘමියා = ...................................................
8. දෛවය = ...................................................
9. ගෞරවය = ...................................................
10. ශෝභමාන = ...................................................

**නාම පද හා එහි ප්‍රභේද:**

- පහත සඳහන් ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තාත්තා අයියාටත් නංගීටත් මටත් එක රතිඤ්ඤා පෙට්ටියක් බැගින් ගෙනැවිත් දෙයි. “පත්තු කළාට තමත් නෑ.තුවාල කරගන්නේ නෑ.” රතිඤ්ඤා දෙන ගමන් තාත්තා අපට කියයි. වෙලාවට පත්තු කිරීම සඳහා අපි ඒවායින් කොටසක් තබා ගත්තෙමු. අවුරුද්දට අවශ්‍ය කරන බොහෝ බඩු බාහිරාදිය අම්මා මිල දී ගන්නේ

කද්දුව කඩ පොළෙනි. සතියකට දෙදිනක් පවත්වන කද්දුව පොළට වෙළඳාම සඳහා මාතර, වැලිගම වැනි ඈත පෙදෙස්වලින් වෙළෙන්දෝ පැමිණෙති. වත්තේ වැටෙන ලොකු කෙසෙල් කැනක් වැනි යමක් විකුණා ගන්නට ඇති විටෙක එය රැගෙන යනවා හැරෙන්නට තාත්තා කද්දුව පොළට නිතර නො යයි. පොළට වැඩිපුර ම යන්නේ අම්මා ය. පොළට යන ඇතැම් දිනෙක අම්මා, තමා විසින් වියා නිම කරන ලද රටා පැදුරක් දෙකක් ද විකුණා ගන්නා මුදලෙන් ඈ ගෙදරට අවශ්‍ය දේ මිල දී ගනී. අවුරුද්දට දින කිහිපයකට පෙර පවත්වන පොළ වෙනත් දිනවල පොළට වඩා සරුසාර ය. එදිනට වැඩිපුර වෙළෙන්දෝ පොළට එති. වැඩිපුර බඩු ද ඔවුහු පොළට ගෙන එති.

- ඡේදයේ සඳහන් ඒකවචන නාම පද බහුවචනයටත් බහුවචන නාම පද ඒකවචනයටත් හරවන්න.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| තාත්තා | |
| | අපි |
| පොළ | |
| | වෙළෙන්දෝ |
| කෙසෙල් කැනක් | |
| | මුදල් |
| අවුරුද්ද | |
| පැදුරක් | |
| | ඔවුහු |
| රතිඤ්ඤා පෙට්ටියක් | |

2 ඡේදයෙන් උක්ත පද 5ක් ලියා අනුක්ත පද බවට හරවන්න.

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| 1. ................................................ | ................................................ |
| 2. ................................................ | ................................................ |
| 3. ................................................ | ................................................ |
| 4. ................................................ | ................................................ |
| 5. ................................................ | ................................................ |

## සිරිත් හොඳ දැනගෙන:

1. ‘සිරිත් හොඳ දැන්ගෙන පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?

.........................................................................................................................................

2. එහි කතුවරයා නම් කරන්න.

.............................................................................................................................................

පහත සඳහන් කව්වල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

වැඩෙක නො යෙදූ සිත
නරක අතට ම පෙරළෙන
..................................................................
..................................................................

..................................................................
..................................................................
තරහට කෑමක් විසි නොකරන්නේ
එළි පිට හිටගෙන කෑම නොකන්නේ

3. පහත සඳහන් අදහස් දෙන කවි පද උපුටා ලියන්න.

(අ) දියුණු වීම සඳහා කම්මැළිකම දුරු කොට වැඩපළ කරන්න.
..................................................................
..................................................................

(ආ) සිරුර වැසෙන ආකාරයෙන් ඊට සුදුසු ඇඳුම් අඳින්න. බඩ නෙරා පෙනෙන ආකාරයෙන් ඇඳුම් නො අඳින්න.
.......................................................................................
.......................................................................................

(ඇ) අනුන්ට ගෞරව කොට සලකන්න. එයින් තමාට ද ගෞරවය ලැබේ.
.......................................................................................
.......................................................................................

(ඈ) කෑමට කෑදරකම් නොකරන්න. තවත් දෙන්න යයි කියමින් කෑ නොගසන්න.
.......................................................................................
.......................................................................................